# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2494/14 – 2026 ජුනි මස 24 වැනි බදාදා – 2026.06.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2026 අංක 46 දරන ආඥාව**

*මගේ යොමු අංකය* : 4-3/12/2018/WS/358.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : BD/HE/LND/5/69.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වන ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2026 අප්‍රේල් මස 28 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, හාලිඇල.

II. ***ඉඩමේ විස්තරය.–*** ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවිනිපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, කුරුකුදේ (57සී) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කුරුකුදේ (අ.ග.පි.14) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/HLE/2019/497 හා 2019.12.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර A - අයිස්ලැබ් වත්ත - ප්‍රමාණය: හෙක්. 0.4047**

උතුරට: මල්වත්තවැලේ වැවිලි සමාගම හිමිකම් කියන අයිස්ලැබ්වත්ත; නැගෙනහිරට: මල්වත්තවැලේ වැවිලි සමාගම හිමිකම් කියන අයිස්ලැබ්වත්ත සහ වතුපාර; දකුණට: වතුපාර සහ මල්වත්තවැලේ වැවිලි සමාගම හිමිකම් කියන අයිස්ලැබ්වත්ත; බටහිරට: මල්වත්තවැලේ වැවිලි සමාගම හිමිකම් කියන අයිස්ලැබ්වත්ත.

EOG 06 – 0274

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2026 අංක 47 දරන ආඥාව**

*මගේ යොමු අංකය* : 4-3/18/2023/WS/70.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : MDS/LD/08/13.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වන ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2026 අප්‍රේල් මස 28 වැනි දින,
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, මදුරාවල.

II. ***ඉඩමේ විස්තරය.–*** බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 815B පහළගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පහළගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KA/MAD/2024/622 හා 2025.06.02 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර A - කොළේමෝදරඹිවිට සහ පිටකට්ටිය *නොහොත්* ගංකන්ද - ප්‍රමාණය: හෙක්. 0.1410**

උතුරට: ගමගේ පියසේන සහ තවත් අය හිමිකම් කියන කොළේමෝදරඹිවිට සහ පිටකට්ටිය, කුඩා ගහ, මු.පි.ක 4393 හි කැබලි අංක 1 සහ 3 (මාර්ගය); නැගෙනහිරට: මු.පි.ක 4393 හි කැබලි අංක 1 සහ 3 (මාර්ගය); දකුණට: මාර්ගය සහ ගමගේ පියසේන සහ තවත් අය හිමිකම් කියන කොළේමෝදරඹිවිට සහ පිටකට්ටිය; බටහිරට: ගමගේ පියසේන සහ තවත් අය හිමිකම් කියන කොළේමෝදරඹිවිට සහ පිටකට්ටිය.

02. **කැබලි අක්ෂර B - කොළේමෝදරඹිවිට සහ පිටකට්ටිය *නොහොත්* ගංකන්ද - ප්‍රමාණය: හෙක්. 0.0264**

උතුරට: මු.පි.ක 4393 හි කැබලි අංක 1 සහ 2; නැගෙනහිරට: ගමගේ දිලුප් ප්‍රේම කුමාර ගමගේ හිමිකම් කියන කොළේමෝදරඹිවිට සහ පිටකට්ටිය *නොහොත්* ගංකන්ද සහ මාර්ගය; දකුණට: ගමගේ දිලුප් ප්‍රේම කුමාර ගමගේ හිමිකම් කියන කොළේමෝදරඹිවිට සහ පිටකට්ටිය *නොහොත්* ගංකන්ද, මාර්ගය සහ මු.පි.ක 4393 හි කැබලි අංක 3 (මාර්ගය); බටහිරට: මු.පි.ක 4393 හි කැබලි අංක 3 (මාර්ගය), 1 සහ 2.

EOG 06 – 0275

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.